## මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග - 1 ව්‍යාපෘතිය - 2012

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2012 දෙසැම්බර් 31 න් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

**(ඇ)** කළමනාකරණය විසින් මාගේ ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දුන් කරුණු නිවැරදි කරගැනීමට සතුටුදායක පියවර ගෙන තිබුණ බව හා

**(ඈ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලැබී තිබෙන තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘති වියදම රු.මිලියන 5,570.88 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. මිලියන 13,413.69 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ස්ථාවර වත්කම් | 1.45 | 0.07 | 1.52 |
| මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද වත්කම් | 3.39 | - | 3.39 |
| කෙරීගෙන යන වැඩ | 8,633.86 | 2,930.36 | 11,564.22 |
| විදේශ විනිමය වෙනස | - | (31) | - |
| අත්තිකාරම් හා කලින් ගෙවීම් | (3,068.24) | 4,912.38 | 1,844.14 |
| මුදල් හා බැංකු ශේෂ | 0.42 | - | 0.42 |
| | 5,570.88 | 7,811.81 | 13,413.69 |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

ප්‍රමාණපත් හරහා මිළට ගත් රු. 37,621,540 වටිනා මගී වාහන 10 ක් මූල්‍ය වාර්තාවල ව්‍යාපෘති ජංගම නොවන වත්කම් යටතේ පෙන්නුම් කිරීම වෙනුවට කෙරීගෙන යන සිවිල් වැඩ යටතේ පෙන්නුම් කර තිබුණි.

### 3.1.2 ඉඩම් අත්පත් කර ගැනීම

කොන්ත්‍රාත්තු අංක ආර්ඩීඒ/ආර්එන්අයිපී/පීආර්පී1/සී1ඒ-3, ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර 2013 මැයි 10 වනවිට ඉඩම් කැබලි 09 ක් අත්පත්කරගෙන නොතිබුණි. වැඩබිම කොන්ත්‍රාත්කරුට පැවරීමේ ප්‍රමාදය කාලය දීර්ඝ කිරීම ලබාදීමට හා පිරිවැය වැඩිවීමට බලපානු ඇත.

### 3.1.3 මානව සම්පත් කළමනාකරණය

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දින නිකුත් කළ අංක 33 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගත යුතුය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ව්‍යාපෘති කාර්යමණ්ඩලය අනුමත කර ඇතත්, අදාල අනුමැතියකින් තොරව උපදේශකවරුන් සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුල රු.1,480,000 පාරිශ්‍රමිකයක් ගෙවා තිබුණි. එම උපදේශකවරුන්ගේ රැකියා කොන්දේසිවල සඳහන් වන පරිදි රැකියා විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර ඇතත් මෙම උපදේශකවරුන්ගෙන් ව්‍යාපෘතියට ප්‍රතිලාභී බලපෑමක් හා දායකත්වයක් ලැබී නොමැති බව විගණනයේදී නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

3.1.4 <u>ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල තත්ත්ව ආරක්ෂණය</u>

කොන්ත්‍රාත්තු අංක සී1ඒ-3 සිරිබෝපුර ගුවන්පාලම ඉදිකිරීම් කටයුතුවලට අදාලව තිරස් ආධාරකයේ සිහින් පැලුම් හා flange-web junction of a post tensioned girder වල මතුපිට අසාමාන්‍යතා අනාවරණය විය. කොන්ත්‍රාත්කරුගේ වැඩ අනුමත ක්‍රමවේදයට අනුකූලව සිදුකර නැති බව මෙම තත්වයෙන් පෙන්නුම් කර තිබුණි.

3.1.5 <u>කොන්ත්‍රාත්තු පරිපාලනය</u>

රජයේ ප්‍රසම්පාදන මගපෙන්වීම්වල 4.3.1 කොටසට අනුව විදුලි සංදේශ රැහැන් ඉවත්කිරීමට හා නැවත ස්ථාපිතකිරීමේ ප්‍රමාණපත්‍රවල විදුලි සංදේශ බදු හා සෙස් බදු එකතුකිරීමට ප්‍රතිපාදනය කර නොතිබුණි. කොන්ත්‍රාත්තු අංක සී1ඒ - 1 හම්බන්තොට සිරිබෝපුර හන්දියේ පවතින විදුලි සංදේශ ජාලය ඉවත්කිරීමට හා නැවත ස්ථාපිතකිරීමේ වැඩ සඳහා රු. 298,138 ක් ඉහත බදු වශයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත ගෙවා තිබුණි.

3.1.6 <u>කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(1) මහනුවර-මහියංගනය පදියතලාව (සී6ඒ) මාර්ග පුනරුත්ථාපනයේදී ඔරුබැඳිවැව ජාතික පාසලේ මායිම් තාප්පයට හානිවී තිබුණි. රක්ෂණ සමාගම වන්දි ගෙවූ මීටර් 95 කට සමාන කොටසක් මායිම් තාප්පයෙන් නැවත ඉදිකර තිබුණි. ඇස්තමේන්තු කළ මුළු ප්‍රතිසංස්කරණ පිරිවැය වටිනාකම රු.843,621 වූ අතර රක්ෂණ සමාගම ගෙවූ තථ්‍ය ගණන රු.572,338 ක් විය. ඉතිරි වටිනාකම රු.271,233 කොන්ත්‍රාත්කරු විසින් විඳදරා ගත යුතු වුවත්, කොන්ත්‍රාත්තු කොන්දේසිවල කිසිදු කොන්ත්‍රාත්තු බැදීමක් නොමැතිව ව්‍යාපෘතිය විසින් වියදම දරා තිබුණි. තවද මායිම් තාප්පය නැවත ඉදිකිරීම සඳහා මාස 11 ක කාලයක් ගෙන තිබුණි.

(2) කොන්ත්‍රාත්තු අංක සී1ඒ-2 කිරිඉබ්බන්ආර - උඩමචිආර මාර්ගයේ විෂයපථ වෙනස්වීම් සිදුකර ඇති බව නිරීක්ෂණය විය. මුල් ඇස්තමේන්තුව මංතීරු 2 ක අවශ්‍යතාවය වෙනුවට මාර්ග කොටස් කි.මී.0+000 සිට කි.මී.6+000 දක්වා මංතීරු 4 අවශ්‍යතාවයට විෂයපථ වෙනස් කර තිබූ අතර බෝපලේ හන්දියේ ඇති සපත්තුපාලම කොන්ත්‍රාත්කරුගෙන් පිරිවැය යෝජනා ලබාගැනීමෙන් පසු ඉවත්කර තිබුණි. දැනට පවතින සපත්තුපාලම පුළුල්කිරීම සඳහා නිර්මාණ සැලසුම් හා දැනට පවතින සපත්තුපාලම ඉවත්කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. බෝපලේ හන්දිය-උඩමචිආර මාර්ග කොටසේ අවශ්‍ය විචලන හඳුන්වාදීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විෂයපථ වෙනස්කිරීම් කර තිබුණි. මුල් ඇස්තමේන්තුවේ විෂයපථය වෙනස්කිරීම නිසා පිරිවැය රු. මිලියන 415 කට සමාන සියයට 52.14 ඉහළ ගොස් තිබුණු බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන මගපෙන්වීම් ඡේද අංක 8.13.4 අනුව සැලසුම් අදියරේදී එය අනාවරණය කරගැනීමට නොහැකිවීමට හේතු ව්‍යාපෘතිය පැහැදිලි කර නොතිබුණි. එම තත්ත්වය ව්‍යාපෘතියේ දුර්වල කොන්ත්‍රාත්තු කළමනාකරණයක් ලෙස පෙන්නුම් කෙරිණි.

(3) කොන්ත්‍රාත්තු අංක සී1ජී-3 සිරිබෝපුර ගුවන්පාලම තැනීම් කොන්ත්‍රාත්තුවට අදාලව උපයෝජන සේවා නැවත ස්ථාපිත කිරීමට හා ඉඩම් අත්කර ගැනීමට සුදුසු කාලරාමුවක් නොතිබුණි. මෙය කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතියට ඉතා තදින් බලපා තිබුණි. උපයෝජන සේවා ඉවත්කිරීමේ ගාස්තු කොන්ත්‍රාත්කරු හරහා ගෙවීම් කර තිබුණු අතර පසුව කොන්ත්‍රාත්කරු අතිරේක ලාභ හා පොදුකාර්ය වියදම් සමග අතුරු ගෙවීම් සහතික මගින් එම ගෙවීම් ව්‍යාපෘතියෙන් ආපසු අයකරගෙන තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

### 3.2 අරමුදල් උපයෝජනය

සමාලෝචිත කාලපරිච්ඡේදයට හා 2012 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍යනය, අයවැය ප්‍රතිපාදනය හා අරමුදල් උපයෝජනයට අදාලව සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකගවී ඇති මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2012 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | % |
| චී.සං.බැංකුව | 152.8 | 15,280 | 6,925.47 | 6,884.99 | 10,268.10 | 67.19 |
| ශ්‍රීලංකා රජය | 17.0 | 1,700 | 592.98 | 592.97 | 1,413.71 | 83.16 |
| | 169.8 | 16,980 | 7,518.45 | * 7,477.96 | *11,681.81 | 68.79 |

* අන්තර් ජංගම ගිණුම් ගනුදෙනු, විදේශ විනිමය අනුපාත වෙනස්වීම්, රඳවාගත් මුදල් හා උපචිත වියදම් බැහැර කිරීම් හේතුකොට ගෙන, මෙම මුදල් මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

### 3.3 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

ණය පහසුකම් ගිවිසුමට අනුව චීන සංවර්ධන සහයෝගීතා බැංකුව මාර්ග වැඩිදියුණුකිරීම් හා පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්තු පැකේජ 6 ක් කරගෙන යෑම සඳහා එ.ජ.ඩොලර් මිලියන 152.8 ක් වෙන්කර තිබුණු අතර නිර්මාණ සැලසුම් වෙනස්වීම් හා අතිරේක වැඩ විචලනයන් වැනි විවිධ විෂය පථ වෙනස්වීම් ක්‍රියාත්මක කාලය තුල සිදුවී තිබුණි. එම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්තුවල බලාපොරොත්තුවූ නිමකිරීමේ දිනයන් දීර්ඝ කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවල භෞතික ප්‍රගතිය පහත පෙන්නුම් කෙරේ.

| කොන්ත්‍රාත්තු අංක | කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත්තු මුදල රු.මිලියන | තථ්‍ය පිරිවැය රු.මිලියන | 2012 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය ඉලක්කය % | තථ්‍ය % |
|---|---|---|---|---|---|
| සී 1 ඒ | **(I)** බෙලිඅත්ත - තංගල්ල මාර්ගය | 1,350 | 1,380 | 100 | 95 |
| | **(II)** බෝපලේ - කිරිඉබ්බන්ආර උඩමච්ආර මාර්ගය<br>**(III)** සිරිබෝපුර හන්දිය ගුවන් පාලම | 2,675 | 1,846 | 100 | 72 |
| සී 2 ඒ | පැලවත්ත - කන්කොට්යාවත්ත තිනියවල - මොරවක මාර්ගය (කි.මී.47) | 3,900 | 1,235 | 71 | 44 |
| සී 3 | තිරුවානකැටිය - අගලවත්ත මාර්ගය (කි.මී 0 - 033.45) | 2,800 | 1,005 | 51 | 38.5 |
| සී 6 ඒ | මහනුවර - මහියංගනය පදියතලාව මාර්ගය | 1,550 | 1,215 | 100 | 90.2 |
| සී 8 | කල්කුඩා - වාලච්චේන මාර්ගය | 700 | 610 | 100 | 100 |
| සී 11 | පරන්තන් - මුලතිව් මාර්ගය (කි.මී.52.13) | 5,700 | 3,920 | 41.36 | 63.79 |